සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගම - 2023

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය ව්‍යාචනය

සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.2 මතය ව්‍යාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාචනය කරනු ලැබේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඇතුලත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මේ හේතුවෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන් වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 32 ඡේදය ප්‍රකාරව ගිණුම්කරණ ප්‍රමිතියක අවසරය හෝ අවශ්‍යතාවය මත හැර ආයතනයක ආදායම් සහ වියදම් හිලව් නොකළ යුතු වුවද සමාලෝචිත වර්ෂයට අදාළව පැල්වත්ත අංශයේ රු.3,406,051,222 ක ආදායම් වියදම් සමඟ හිලව්කර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබුණි.	ණය පදනමට ලබා දෙන භාණ්ඩ හා සේවාවලට අදාළ වියදම් ගිණුම් බැර නොකර ආදායම් ලෙස දක්වා ගොවි ණය ගිණුම්වලට හරකිරීම හේතුවෙන් ශේෂ පිරික්සුම තුළ එම ශේෂය ඇතුළත් බව.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව ආදායම් වියදම් හිලව් කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 117 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිතා කරන වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතු වුවද සෙවනගල අංශයට අදාළව 2014 වර්ෂයේ සිට ආයතන දෙකකින් සහ එක් ව්‍යාපෘතියකින් අයවිය යුතු රු.20,141,781 අඩමාන ණය වශයෙන් වෙන්කර තිබුණු නමුත්, එම වෙන් කිරීම්වලට හේතු වූ කරුණු හා අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.	එළඹෙන වසරේදී නිවැරදි කිරීමට එකඟ වන බව.	අඩමාන ණය වෙන් කිරීමේ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කළ යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණු බැවින් තවදුරටත් භාවිතයේ පවතින	2024 වර්ෂයේදී පැල්වත්ත ඒකකයේ වත්කම් ප්‍රත්‍යාගණනය සිදුකර ඇති අතර සෙවනගල ඒකකයේ ද වත්කම් ප්‍රත්‍යාගණනය සිදු කරමින් පවතින බව සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය

	සෙවනගල අංශයේ පිරිවැය රු.386,601,213 ක හා පැල්වත්ත අංශයේ පිරිවැය රු.1,745,910,345 ක දේපළ පිරියත හා උපකරණ සමාලෝචිත වර්ෂය අවසානය වන විට සම්පූර්ණයෙන්ම ක්ෂය කර අවසන්කර තිබුණි. ඒ අනුව මෙම ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	ලබාගෙන ගිණුම් වාර්තා තුළ ගැලපීමට කටයුතු කරන බව.	කිරීමටත්, ප්‍රමිති අංක 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමටත් කටයුතු කළ යුතුය.
(ඈ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 02 අනුව පෙර පිවිසි පෙර නිකුතු ක්‍රමයට හෝ හරිත සාමාන්‍ය ක්‍රමයට තොග නිකුත් කිරීම මිල කළ යුතු වුවද පැල්වත්ත අංශය විසින් නිකුත් කරන තොග අවසන් වරට මිලදීගෙන ඇති තොගවල මිල මත පදනම්ව අගයකර තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී පිරිවැය හා නිකුතු මිල අතර ඇති වී තිබුණු රු.25,176,099 වෙනස තක්සේරු ගැලපීම් ගිණුමක් මගින් මූල්‍ය ප්‍රකාශනවල වියදමට ගලපා තිබුණි. ගිණුම්කරණ මෘදුකාංගයේ පවතින දෝෂයක් හේතුවෙන් සිදුවන මෙම ගිණුම් ගැලපීම නිසා මූල්‍ය ප්‍රකාශනවල ඒ ඒ වියදම් අයිතමයන්හි නිවැරදි වියදම නිරූපණය නොවන බවට නිරීක්ෂණය විය.	ආයතනය විසින් භාවිතා කරනු ලබන ගිණුම්කරන පද්ධතියට අනුව තොග පවත්වා ගැනීම සඳහා මිලදීගනු ලබන සෑම අයිතමයක්ම අවසන් වරට මිලදීගත් ඒකක මිලට අගය වේ. මෙලෙස මාසිකව එකතු වන තොග වටිනාකම්වල වෙනස පිරිවැය වාර්තාවල සමානුපාතිකව ගැලපුම් කිරීම ආරම්භයේ සිටම සිදුකර ඇත. නව ගිණුම්කරන මෘදුකාංගය ස්ථාපනය කිරීමේදී හරිත සාමාන්‍ය ක්‍රමයට තොග මිල කිරීමට තිරණය කර ඇති බව.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 02 ප්‍රකාරව තොග අගය කිරීම සිදුකර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.
(ඉ)	ප්‍රාග්ධන වත්කම් මිලට ගැනීම සහ ඉදිකිරීම සඳහා 2014 වර්ෂයේ සිට අවස්ථා 06 කදී රු.645,635,024 ක් රාජ්‍ය ප්‍රදාන වශයෙන් ලැබී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට අදාළ වත්කම් ඉදිකිරීම/ මිලට ගැනීම අවසන් කර තිබුණි. කෙසේ නමුත් මෙම රාජ්‍ය ප්‍රදාන පිළිබඳව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 20 අනුව ගැලපීම් සිදුකර නොතිබුණු බැවින් රාජ්‍ය ප්‍රදාන එම වටිනාකමින් වැඩියෙන්ද රඳවාගත් ඉපයුම එම වටිනාකමින් අඩුවෙන්ද දක්වා තිබුණි.	කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා රජය විසින් යොදවා ඇති මුදල් රාජ්‍ය ප්‍රධාන ලෙස හඳුනාගෙන හිමිකම වැඩි වන ආකාරයට සටහන් තබා ඇති බව සහ 2024 වර්ෂයේදී නිවැරදි කරන බව	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 20 අනුව රාජ්‍ය ප්‍රධාන නිවැරදිව වාර්තා කළ යුතුය

(ඊ)	2012 වර්ෂයේදී සමාගම රජයට පවරා ගන්නා අවස්ථාවේදී ඵලදායිතා සංවර්ධන අමාත්‍යාංශය, මොණරාගල සහ හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් රු.819,520,305 ක කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා රාජ්‍ය ප්‍රදාන ලබාදී තිබුණි. මෙම රාජ්‍ය ප්‍රදාන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 20 අනුව ගිණුම්ගත කර නොතිබුණු බැවින් රඳවාගත් ඉපයුම් එම වටිනාකමින් අඩුවෙන්ද ප්‍රාග්ධන ප්‍රදාන එම වටිනාකමින් වැඩියෙන්ද දක්වා තිබුණි.	කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා රජය විසින් යොදවා ඇති මුදල් රාජ්‍ය ප්‍රධාන ලෙස හඳුනාගෙන හිමිකම වැඩි වන ආකාරයට සටහන් තබා ඇති බව සහ 2024 වර්ෂයේදී නිවැරදි කරන බව	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 20 අනුව රාජ්‍ය ප්‍රධාන නිවැරදිව වාර්තා කළ යුතුය
(උ)	2022 වර්ෂයේ අප්‍රේල් සහ ජූලි මාසවල අවස්ථා 05 කදී සමාගමේ පැල්වත්ත ඒකකයෙන් සෙවනගල ඒකකය වෙත නිකුත් කර තිබුණු රු.7,487,688 ක් වටිනා දැව්තෙල් ලීටර් 32,136 ක් 2022 වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත නොකර සමාලෝචිත වර්ෂයේ අන්තර සමාගම් ගිණුමට හර තිබුණු බැවින් සමාලෝචිත වර්ෂය අවසාන දිනට වෙනත් ලැබිය යුතු දෑ සහ රඳවාගත් ඉපයුම රු.7,487,688 ක් බැගින් වැඩියෙන් දක්වා තිබුණි.	දැව් තෙල් තොගය සෙවනගල ඒකකය වෙත ලැබී ඇති බව සහ භාවිතා කර ඇති බවට ලේඛන ඇති බව.	භාවිතා කර ඇති දැව් තෙල් තොගය වියදම් ලෙස හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පිරිවැය රු.760,763,818 ක් වූ පැල්වත්ත අංශයේ ස්ථාපිත ස්කාගාර දෙපාර්තමේන්තුවේ ස්ථාවර වත්කම් වල එක් එක් වත්කම් පන්තිවල එකතුව පමණක් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර තිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම හා ක්ෂය වෙන් කිරීම්වල නිරවද්‍යතාවය විගණනයට තහවුරු නොකෙරුණි.	වත්කම් තක්සේරුකරණයේදී මෙම වත්කම් ද වෙන වෙනම අයිතම වශයෙන් තක්සේරු කර ලේඛනගත කිරීමට සැලසුම් කර ඇති බව.	වත්කම් නිවැරදිව හඳුනාගෙන ඊට අදාළ ක්ෂය වියදම හා ක්ෂය වෙන්කිරීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

(ආ)	පැල්වත්ත අංශයට අයත් කල්බදු වත්කම් ද සමඟ පිරිවැය රු.3,507,888,055 ක් වූ ක්ෂේත්‍ර යන්ත්‍ර හා උපකරණ, වාරිමාර්ග හා විවිධ උපකරණ සහ කර්මාන්තශාලා බලාගාරය හා උපකරණවල ක්ෂය අනුපාතයන් පිළිවෙලින් සියයට 15 ක්, 6 ක් හා 5 ක් වන නමුත්, එම වත්කම් වලට අයත් පිරිවැය රු.1,682,142,372 ක් වූ වත්කම් සියයට 2 ත් සියයට 50 ත් අතර විවිධ අනුපාතයන් යටතේ ක්ෂය කර තිබුණු බැවින් සමාලෝචිත වර්ෂයට අදාළ ක්ෂය වියදම හා ක්ෂය වෙන්කිරීම්වල නිරවද්‍යතාවය තහවුරු නොකෙරුණි.	ඉදිරියේදී වත්කම් ප්‍රත්‍යාගණනයත් සමඟ ආයතනයේ ක්ෂය ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව.	ක්ෂය කළ යුතු වත්කම් සඳහා නිශ්චිත ක්ෂය අනුපාතයන් තීරණය කළ යුතු අතර ක්ෂය කිරීමේ ප්‍රතිපත්තියට අනුකූලව ක්ෂය ගණනය කළ යුතුය.
(ඇ)	සෙවනගල හා පැල්වත්ත අංශවල වසර 08 කට අධික කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනෙමින් පවතින පිළිවෙලින් රු.9,475,416 සහ රු.4,904,160 ක් වූ මාර්ගස්ථ තොග සම්බන්ධයෙන් ඉකුත් වර්ෂවල විගණන වාර්තාව මඟින්ද පෙන්වාදී තිබුණු නමුත් එම ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	වසර 10ක් පමණ කාලයක් ගතවී ඇති රු. 4,904,160ක මාර්ගස්ථ තොග තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය ලේඛන සොයා ගැනීම අපහසු බව සහ ඉදිරියේදී තොරතුරු සොයාගෙන නිවැරදි කරන බව.	මෙම භාණ්ඩ ලැබී තිබේද යන්න පිළිබඳව සොයා බලා ගිණුම්වල ගැලපීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඈ)	පැල්වත්ත අංශය භුක්ති විඳින හෙක්ටයාර 1.212 කින් සමන්විත බඩල්කුඹුර උක් මිලදී ගැනීම් මධ්‍යස්ථානයෙහි ඉඩමෙහි සින්නක්කර අයිතිය සීනි සමාගමට නොතිබුණු නමුත් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් හෙළිදරව් කර නොතිබුණි.	ඉඩමේ අයිතිය පිළිබඳ කිසිදු ලියකියවිල්ලක් ආයතනය සතුව නොමැති එබැවින් වාර්තාවලට ඇතුළත් කර ගැනීමේ ගැටලුවක් පවතින බව සහ ගිණුම් වාර්තා තුළ මෙම ඉඩම ඇතුළත් නොවන නිසා හෙළිදරව් කිරීමට කටයුතු කර නොමැති බව.	සමාගම විසින් භුක්ති විඳින ඉඩම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය.
(ඉ)	සමාලෝචිත වර්ෂය අවසාන දිනට සෙවනගල අංශය විසින් ව්‍යාපාර සම්පත් සැලසුම් කරන පද්ධතිය (ERP System) සඳහා දරන ලද වියදම රු.30,544,015 ක් වුවද එය රු.35,650,647 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි.	රු.5,106'632ක මුදල ප්‍රධාන කාර්යාලය වෙනුවෙන් ගෙවා ඇති බැවින් පාලන ගිණුම් හරහා නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ERP පද්ධතියේ නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ යුතුය.

(ඊ)	සමාලෝචිත වර්ෂයේ භෞතික තොග සමීක්ෂණ වාර්තා අනුව සෙවනගල අංශයේ ගබඩාවන්හි රු.6,777,664 ක් වටිනා තොග අයිතම 306 ක ඌනතාවයක් හා රු.5,192,624 ක් වටිනා තොග අයිතම 429 ක අතිරික්තයක් නිරීක්ෂණය වූ නමුත්, ඒ සඳහා මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් කර නොතිබුණි. භෞතිකව සත්‍යාපනය කරන ලද වටිනාකම ගණනය කළ නොහැකි තොග වර්ග 1195 ක් ද, ප්‍රයෝජනයට ගත නොහැකි හා අපහරණය කළ යුතු රු.4,044,995 ක් වටිනා තොග අයිතම 504 ක් ද ගබඩාවේ පැවතුණි. එම තොග සම්බන්ධයෙන්ද මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් කර නොතිබුණි.	විගණන නිරීක්ෂණය සමග එකඟවන බව සහ රජයට පවරා ගන්නා අවස්ථාවේදී මෙම තොග මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණු බව	භෞතිකව සත්‍යාපනය කරන ලද සියලු තොග වර්ග මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු අතර, තොග ඌනතා හා අතිරික්තතා සම්බන්ධයෙන් විධිමත් පරිදි කටයුතු කළ යුතුය.

1.5.3 නොසැසඳුන පාලන ගිණුම් හෝ වාර්තා

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භෞතික තොග සමීක්ෂණ වාර්තාව අනුව සෙවනගල අංශයේ තොග ශේෂය රු.2,764,156,341 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන අනුව එම වටිනාකම රු.3,675,660,095 ක් වූයෙන් අවසන් තොගය රු.911,503,754 ක් වැඩියෙන් දක්වා තිබුණි.	2011 වර්ෂයේ සමාගම රජයට පවරා ගැනීමේ පනත අනුව නිශ්චල දේපළ පමණක් පවරාගෙන ඇති අතර චංචල දේපළ ගිණුම්ගත කර නොමැති බව සහ මේ හේතුවෙන් තොග සමීක්ෂණ වාර්තා අනුව ශේෂය සහ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් අතර වෙනසක් ඇති බව.	අවසන් තොග ශේෂය නිවැරදිව මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් කළ යුතුය.

1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැල්වත්ත අංශයේ පැවති රු2,463,859,790 ක සීනි තොගය භෞතිකව සත්‍යාපනය කර නොතිබුණු බැවින් එම ශේෂයෙහි නිරවද්‍යතාවය විගණනයට තහවුරු නොකෙරුණි.	ගබඩා කිරීමේදී සහ නිකුත් කිරීමේදී ඇතිවන තෙරපීම නිසා ගණනය කිරීම සඳහා සීනිමිටි පැහැදිලිව දර්ශනය නොවන බව සහ එම තත්ත්වය නිවැරදි කර ගැනීමට අවශ්‍ය සුදුසු පියවර ගන්නා බව.	සියලුම තොග භෞතිකව සත්‍යාපනය කර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ යුතුය.
(ආ)	පැල්වත්ත සීනි කර්මාන්තායතනය රජයට පවරා ගැනීමේදී එයින් ඉවත්ව	අදාළ ආයතනය සමඟ පැවති නිවාස සම්බන්ධ ගිවිසුම	මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් සම්බන්ධිත

	වෙනම ආයතනයක් ලෙස කිරි ආශ්‍රිත නිෂ්පාදන සිදු කරන ආයතනයකට, අයත් ට්‍රැක්ටර් 20 ක් 2011 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා භාවිතා කිරීම වෙනුවෙන් එම ආයතනයට ගෙවිය යුතු රු.65,386,355 ක ශුද්ධ මුදල සහ එම ආයතනය විසින් සමාගමට අයත් නිල නිවාස භාවිතා කිරීම වෙනුවෙන් ලැබිය යුතු රු.19,601,068 ක් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන නමුත්, එම ශේෂ තහවුරු කර ගැනීම සඳහා බඳු ගිවිසුම් හෝ ශේෂ සනාථන ලිපි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	අවලංගු කර අදාළ නිවාස පවරා ගැනීමට කටයුතු කර ඇති බව, තවත් නිවාස 04ක් නිදහස් කර ගැනීමට තිබෙන බව, ට්‍රැක්ටර් 20 නැවත ලබාදීමට සාකච්ඡා කරන බව, මෙම ආයතනය සමඟ පවතින ගනුදෙනු නිරවුල් කිරීමට කටයුතු කරන බව සහ ඉදිරියේදී මුදල් පදනම මත පමණක් ගිවිසුම් ගතව කටයුතු කරන බව.	රාජ්‍ය හා පෞද්ගලික සමාගම් වලින් හා සීමාසහිත ලංකා සීනි සමාගමේ ඒ ඒ අංශ අතර සිදුවන ගණුදෙනු වලින් ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ විස්තරාත්මකව හෙළදරව් කළ යුතු අතර, ඒවා තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය.
(ඇ)	පැල්වත්ත ඒකකයෙන් 2022 ජූලි අවස්ථා 02 කදී සෙවනගල අංශය වෙත ප්‍රවාහනය කරන ලද රු.5,359,848 ක් වටිනා දැව්තෙල් ලීටර් 12792, සෙවනගල ඒකකය වෙත ලැබුණු බවට විගණනයට සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි.	එකඟ වේ. දැව් තෙල් තොගය සෙවනගල ඒකකය වෙත ලැබී භාවිතා කළ බවට ලියකියවිලි ඇති බව.	විගණනයට අවශ්‍ය සියලු ලිඛිත සාක්ෂි විගණන අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතුය.

1.6 නීති,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	**අනුකූල නොවීම**	**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 (අ) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව අමාත්‍යවරයා විසින් 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරන ලද නියෝගයන්හි 1 කොටසේ 30 වන නියෝගය	සමාගම සීනි නිෂ්පාදනය හෝ සීනි පිරිපහදු කිරීම සම්බන්ධයෙන් වන වාර්ෂික පාරිසරික බලපත්‍රය ලබාගෙන නොතිබුණි.	වාර්ෂික පාරිසරික බලපත්‍රය ලබා ගැනීමට අවශ්‍ය නෛතික අවශ්‍යතා සම්පූර්ණ කරමින් පවතින බව.	පරිසර ආරක්ෂණ ක්‍රමවේදයන් ස්ථාපිත කර පනත ප්‍රකාරව පරිසර බලපත්‍ර ලබාගත යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය			
(i)	XIX පරිච්ඡේදයේ 5.1 ඡේදය	පැල්වත්ත අංශයේ නිලධාරීන්ගේ නිවාස සඳහා නිවාස කුලී	මෙම නිවාස සඳහා කුලී මුදලක් තීරණය කිරීමටත් යම් සීමාවක් දක්වා නඩත්තු	නිවාස සඳහා නිලධාරීන් ගෙන් කුලී

		අයකර නොතිබුණු අතර, එම නිවාසවල අළුත්වැඩියා හා නඩත්තු වියදම් සමාගම විසින් දරා තිබුණි.	වියදම් අදාළ සේවකයින් වෙත පැවරීමටත් අදාළ වාර්තාවක් ලබාදීමට කමිටුවක් පත් කර ඇති බව.	අයකර ගත යුතුය.
(ii)	XIX පරිච්ඡේදයේ 5.2 ඡේදය	මාසික නිවාස කුලිය සේවකයාගේ වැටුපෙන් ප්‍රතිශතක් ලෙස අයකල යුතු වුවද සමාගමේ සෙවනගල අංශය විසින් ඒ අනුව කටයුතු නොකර මාසිකව රු.100 ත් 850 ත් අතර විවිධ ගාස්තු ප්‍රමාණයෙන් නාමික කුලී ලෙස අයකර තිබුණි.	මාසික නිවාස කුලිය සංශෝධනය සඳහා නිවාස වල ආර්ථික වටිනාකම ගණනය කිරීමට තක්සේරු කටයුතු සිදුකරමින් පවතින බව.	වර්තමාන වෙළඳපොල තත්ත්වයට ගැලපෙන පරිදි නිවාස කුලිය සංශෝධනය කළ යුතුය.
(iii)	XIX පරිච්ඡේදයේ 5.8 ඡේදය	ජල බිල්පත් හා විදුලි බිල්පත් නිලධාරියා විසින් ගෙවිය යුතු වුවද සෙවනගල අංශයේ ජල පරිභෝජනය ඒකක 60 කට වැඩියෙන් භාවිතා කර ඇති අවස්ථාවලදී පමණක් නිලධාරියාගෙන් ගාස්තු අයකර ගැනීමත්, විදුලි පරිභෝජනය සඳහා මාසිකව රු.250 ක සහනයක් ලබාදීමෙන් පසු ඉතිරි විදුලි බිල වැටුපෙන් අයකර ගැනීමත් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී සමාගමේ නිලධාරීන්ට අදාළ රු.11,394,170 ක පෞද්ගලික බිල්පත් පියවීමට සමාගමේ අරමුදල් භාවිතා කර තිබුණි.	සෙවනගල ඒකකය ආරම්භයේ සිටම සේවකයින් සඳහා මෙම සහනය ලබාදී ඇති බව සහ ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇති බව.	විදුලිය හා ජලය සඳහා වන ගාස්තුව නිලධාරියා විසින් දරාගත යුතුය. සමාගම විසින් ගෙවන ලද ගාස්තුව ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි අංක 371 (02) සහ	මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිම	අදහස් දක්වා නොමැත.	විධිමත් පරීක්ෂණය ක් පවත්වා සමාගමට

	2021 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	මුදලක් දක්වා ගණන් දීමේ නිලධාරීගේ අනුමැතිය මත තත්ත්කාර්ය අතුරු අග්‍රිම ලබාදිය හැකි වුවද එයට අනුකූල නොවන ලෙස ප්‍රධාන විධායක නිලධාරීගේ අනුමැතිය මත ඉදිකිරීම් කටයුත්තක් සඳහා සිවිල් නඩත්තු කළමනාකරු වෙත රු. 5,310,000 ක අත්තිකාරම් මුදල් ලබාදී තිබුණි. විගණිත දිනය වන විට අදාළ කාර්ය අවසන් කර මාස 05 ක් ගතවී තිබුණු නමුත් එම අත්තිකාරම් මුදල් පියවා නොතිබුණි. තවද මේ සඳහා ඉදිකිරීම් ද්‍රව්‍ය මිලට ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය නොකර සමාගමේ සිවිල් නඩත්තු කළමනාකරුගේ අභිමතය පරිදි රු.5,130,000 ක මුදල වැයකර තිබුණි. ඒ අනුව, සමාගමට හිමිකමක් නොමැති ගොඩනැගිල්ලක් නවීකරණය සඳහා රු.5,310,000 ක රාජ්‍ය මුදල් වැයකර තිබුණු අතර සමාගමේ ප්‍රධාන විධායක නිලධාරීගේ අනුමැතිය මත මෙම කටයුතු සිදුකර තිබුණි.		අලාභයක් සිදු වී ඇත්නම් ඒවා අය කර ගත යුතු අතර වගකිවයුතු පාර්ශ්වයන්ට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඈ)	2023 දෙසැම්බර් 11 දිනැති අංක PED 04/2023 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ			
	(i) 1.1 ඡේදය	යොමුගත ඡේදය ප්‍රකාරව සෙවනගල	ආයතනය විසින් ගණනය කරන ලද සමීකරණයකට	චක්‍රලේඛ විධිවිධානව

		අංශයේ සහ ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් සඳහා සමාලෝචිත වර්ෂයට අදාළව ගෙවිය හැකි ප්‍රසාද දීමනාව රු.27,225,000 ක් වුවද ප්‍රසාද දීමනා සහ දිරිදීමනා වශයෙන් රු.133,572,776 ක් ගෙවා තිබුණු බැවින් උක්ත විධිවිධාන වලට පටහැනිව රු.106,347,776 ක් වැඩියෙන් ගෙවා තිබුණි.	අනුව දිරිදීමනා ගෙවීම සිදුකරන බව.	ලට පටහැනි ලෙස ගෙවා ඇති මුදල් නැවත අය කර ගත යුතු අතර ගෙවීම් සිදු කිරීමට අදාල වගකිවයුතු පාර්ශ්වයන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
	(ii) 1.2 ඡේදය	යොමුගත ඡේදය අනුව පැල්වත්ත අංශය සඳහා සමාලෝචිත වර්ෂයට අදාළව ගෙවිය හැකි දිරිදීමනාව රු.80,600,000ක් වුවද දිරිදීමනා වශයෙන් රු.319,653,062ක් ගෙවීම් සිදුකර තිබුණි. ඒ අනුව උක්ත විධිවිධාන වලට පටහැනිව රු.239,053,062ක් වැඩියෙන් ගෙවා තිබුණි.	ආයතනය විසින් ගණනය කරන ලද සමීකරණයකට අනුව දිරිදීමනා ගෙවීම සිදුකරන බව.	චක්‍රලේඛ විධිවිධානව ලට පටහැනි ලෙස ගෙවා ඇති මුදල් නැවත අය කර ගත යුතු අතර වගකිවයුතු පාර්ශ්වයන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඉ)	2023 මැයි 16 දිනැති අංක 01/2021(i)රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් සංශෝධිත 2021 නොවැම්බර් 11 දිනැති රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොතේ 6.9 ඡේදය	රාජ්‍ය ව්‍යාපාර විසින් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සමාගම වෙත ලැබිය යුතු මුදල්/පාඩු කපා හැරීම් සිදු කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩල විසින් විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශ ලබා ගැනීමට කටයුතු කල යුතු වුවද, සමාගම එම විධිවිධාන අනුව කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේදී	2015 දෙසැම්බර් 31 දිනට පෙර නිකුත් කරන ලද ගොවි ණය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත කපා හැරීම සිදුකර ඇති බව	චක්‍රලේඛ විධිවිධාන අනුගමනය නොකර ගොවි ණය කපා හැරීමට අදාලව වගකිවයුතු පාර්ශ්වයන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

		රු.473,274,504 ක කපාහැරීම් සිදුකර තිබුණි.		
(ඊ)	2022 ජනවාරි 14 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	චක්‍රලේඛ විධිවිධානව ලට අනුකූල නොවන ලෙස පැල්වත්ත හා සෙවනගල අංශවල නිලධාරීන 22 ක් සඳහා ඉන්ධන ලීටර 34,777 ක් වැඩිපුර ලබාදී ඒ සඳහා රු.11,782,196 ක් ගෙවා තිබුණි.	සමාගමේ කළමනාකාරීත්වය විසින් අනුමත කරන ලද අභ්‍යන්තර චක්‍රලේඛනයකට අනුව ගෙවීම් කර ඇති බව.	චක්‍රලේඛන විධිවිධානව ලට පටහැනි ලෙස ගෙවා ඇති මුදල් නැවත අය කර ගත යුතු අතර වගකිවයුතු පාර්ශ්වයන් ට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.2,835,118,969 ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු.6,045,575,871 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,210,456,902 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පෙර වර්ෂයට සාපේක්ෂව සමාගමේ මුළු වියදම රු.159,659,807 කින් වැඩි වීමත් මුළු ආදායම රු.3,050,797,095 කින් අඩුවීමත් මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

3. වෙනත් විගණන නිරීක්ෂණ

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සෙවනගල කර්මාන්තශාලාවේ ධාරිතාවය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය 2023 අප්‍රේල් 23 දින ආරම්භකර තිබුණු නමුත් මෙම ව්‍යාපෘතිය 2024 අගෝස්තු 07 දින වන විටත් ක්‍රියාත්මක තත්ත්වයට පත්කර නොතිබුණු අතර ඒ සඳහා ආනයනය කර තිබුණු රු.201,782,433 ක යන්ත්‍රවල වගකීම් කාලය ඉකුත් වී තිබුණි. යන්ත්‍ර ආනයනය කිරීමේ ක්‍රියාවලියේ දුර්වලතා හේතුවෙන් රු.3,622,005 ක ප්‍රමාද ගාස්තු ගෙවා තිබුණි.	මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා ඇති අතර එහි වාර්තාව කඩිනමින් ලබාදීමට කටයුතු කරන බව.	ව්‍යාපෘතිය කඩිනමින් නිමකර භාවිතයට ගත යුතුය. තවද, විධිමත් පරීක්ෂන පවත්වා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී සමාගමට සිදුකර තිබෙන අලාභයන් පවතී නම් ඒවා අය කර ගත යුතු අතර වගකිවයුතු පාර්ශ්වයන්ට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

	ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය නොකර රු.7,723,058 ක යන්ත්‍රයක් ආනයනය කර තිබුණු අතර, යන්ත්‍ර සවිකිරීම සඳහා ඉන්දියාවේ සිට පැමිණි සැපයුම්කරුගේ සේවකයන් වෙත ආහාරපාන සහ ප්‍රවාහන පහසුකම් ලබදීම සඳහා රු.2,824,704 ක් වැයකර තිබුණි.		
(ආ)	සමාගමේ පැල්වත්ත හා සෙවනගල ඒකකයන්හි බොයිලේරු සඳහා දැවිතෙල් මිලදීගැනීමේදී ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවෙන් මිලදී නොගෙන, ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටීන් අනුගමනය නොකර බාහිර පුද්ගලයෙකු වෙත දැවිතෙල් මිලදීගැනීමේ ටෙන්ඩරය පිරිනමා තිබුණි. ඒ අනුව අදාළ සැපයුම්කරු විසින් පිරිපහදු කළ දැවිතෙල් වෙනුවට නැව් සහ යන්ත්‍ර වලින් ඉවත් කරන ලද පිරිපහදු නොකළ කළුතෙල් සපයා තිබුණු අතර සමාගම ඒ වෙනුවෙන් රු.341,687,582 ක් ගෙවා තිබුණි. එම කළුතෙල් භාවිතා කළ කාල සීමාවේ බොයිලේරුව නිරන්තරයෙන් අක්‍රිය වී තිබුණු බැවින් එම අක්‍රීය වී තිබූ දින 46 ක කාලය තුල රු. මිලියන 300 ක් වටිනා එතනෝල් ලීටර් 6000 ක නිෂ්පාදනයක් සමාගමට අහිමි වී තිබුණි.	මේ සම්බන්ධයෙන් සිදුකෙරෙන අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන කටයුතු නිමවූ පසු එම ලිය කියවිලි ලබාගෙන පිළිතුරු ලබාදෙන බව.	කොමිෂන් සභාව මගින් විධිමත් පරිදි අදාල ලේඛන ලබා ගැනීමට කටයුතු කර සමාගමට සිදු වී ඇති අලාභය නැවත අය කර ගැනීමටත් වගකිවයුතු පාර්ශ්වයන්ට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ඇ)	2011 වර්ෂයේ සහ ඉන් පසු වර්ෂවලදී ආරම්භ කර තිබූ විවිධ ව්‍යාපෘති 11 ක් මුළුමනින්ම අත්හැර දමා තිබූ අතර එකී ව්‍යාපෘති 11 සඳහා 2022 මාර්තු මස අවසන් වනවිට රු.176,665,880 ක් වැය කර තිබුණි. එමෙන්ම අදාළ ව්‍යාපෘතිය ආරම්භ කර දැනට වසර 09 සිට 13 හෝ ඊට වැඩි කාලයක් ගතවී තිබුණද එම	ව්‍යාපෘති 02ක් පුද්ගලික හිමිකාරීත්වය යටතේ පැවති සමයේදී ආරම්භ කර ඇති බව, ව්‍යාපෘති 09ක් රජයට පවරා ගැනීමෙන් පසු ආරම්භ කළ ඒවා බව සහ මේ පිළිබඳව තවදුරටත් පරීක්ෂා කර බලා මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කිරීමට ඇති හැකියාව තීරණය කරන බව.	සමාගම රජයට පවරා ගැනීමෙන් පසුව නිසි අධ්‍යයනයකින් තොරව ක්‍රියාත්මක කර දැනට අත්හැර දමා ඇති ව්‍යාපෘති සඳහා සමාගමේ මුදල් වැය කළ පාර්ශ්වයන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

	ව්‍යාපෘති නිම කිරීමට අපොහොසත්ව තිබුණි. ඒ අනුව වැයකර තිබූ රු. මිලියන 176 ක වියදම නිශ්කාර්ය වියදමක් බවට පත්වී තිබූ අතර සමාගම අපේක්ෂා කරන ලද අරමුණු ඉටුකර ගැනීමටද නොහැකි වී තිබුණි.		
(ඈ)	2011 වර්ෂයේදී සී/ස ලංකා සීනි සමාගමේ පැල්වත්ත ඒකකය රජයට පවරා ගැනීමෙන් පසු සමාගමේ එම ඒකකය සඳහා කාර්ය මණ්ඩල අවශ්‍යතාවය (Cadre) හඳුනාගෙන මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර සේවක සංඛ්‍යාව අනුමත කිරීමට සහ විධිමත් බඳවාගැනීමේ පරිපාටි සකස් කර අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේ තිබියදී 2021/2022 වර්ෂ වලදී අවිධිමත් ලෙස අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් සේවකයින් 159 ක් බඳවාගෙන තිබුණි. එසේම සේවකයින් 510 ක් වෙත සුදුසුකම හා පළපුරුද්ද විධිමත් පරිපාටියක් අනුගමනය කරමින්, පරීක්ෂා කිරීමකින් තොරව උසස්වීම් ප්‍රදානය කර තිබුණි.	රජයට පවරාගන්නා විට පිරිස් බල තක්සේරුව හඳුනාගෙන අනුමත කර නොතිබුණු බව, අවශ්‍යතාවය මත වරින් වර කළමනාකරණය විසින් සේවකයින් බඳවාගෙන ඇති බව, පිරිස් බල සැලැස්මක් සකස් කර අනුමත කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති බව සහ දීර්ඝ කාලයක් එකම ශ්‍රේණියේ සේවය කිරීමෙන් සේවකයින් අසතුටට පත්වීම වැළැක්වීම සඳහා උසස් වීම් ලබාදී ඇති බව.	උචිත පිරිස් බල සැලැස්මක් සකස් කර අනුමත කරගත යුතුය. තවද, අවිධිමත් ලෙස ලබාදී ඇති පත්වීම් සහ උසස් වීම් පිළිබඳ නැවත පරීක්ෂාකර එම සේවකයින් විධිමත් පරිදි සමාගමේ කාර්ය මණ්ඩලයට ඇතුළත් කර ගැනීමේ හැකියාව සලකා බැලිය යුතුය.
(ඉ)	සමාගමේ සෙවනගල අංශයේ ස්කාගාරය සඳහා අවශ්‍ය ස්ටීම් (Steam) ලබාගැනීම සඳහා බාහිර පුද්ගලයෙකුට අයත් බයෝමාස් බොයිලේරුවක් ආයතනය තුළ ස්ථාපනය කර වාර්ෂිකව අවශ්‍ය වන ස්ටීම් මෙට්‍රික් ටොන් 32400 ක් රු.317,520,000 කට ලබා ගැනීමට ගිවිසුම්ගත වී තිබුණු නමුත් අදාළ සැපයුම්කරු තෝරා ගැනීමේදී විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටි අනුගමනය කර නොතිබුණි. තවද, මෙම ව්‍යාපෘතිය සඳහා කර්මාන්තශාලා	විගණන නිරීක්ෂණය සමග එකඟවනන බව, පිරිවැය ප්‍රතිලාභ වාර්තාවක් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇතිබව, අදාළ කාලයේදී විදේශ සංචිත හිඟතාවය මත යන්ත්‍ර ආනයනය කිරීමට ප්‍රමාද වූ බව, අමුද්‍රව්‍ය හිඟතාවය මත සිවිල් වැඩ සම්පූර්ණ කිරීමට ප්‍රමාද වූ බව සහ BOO ක්‍රමය යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන නිසා කාර්ය සාධන බැඳුම්කරයක් අවශ්‍ය නොවන බව.	විධිමත් ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය නොකිරීම සම්බන්ධයෙන්, අවිධිමත් පිරිවැය ප්‍රතිලාභ වාර්තා සකස් කිරීම සම්බන්ධයෙන් සහ විධිමත් අනුමැතියකින් තොරව සහ කාර්ය සාධන ඇපකර ලබා නොගෙන සැපයුම් කරුවෙත අත්තිකාරම් මුදල් නිකුත් කිරීමසම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශ්වයන්ට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

	උපදේශක විසින් ව්‍යාජ ලෙස සැකසූ දත්ත ඇතුළත් කර පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන තිබුණි. තවද 2024 අගෝස්තු 07 දින වන විටත් අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින නමුත් සැපයුම්කරු වෙත රු.48,600,000 ක අත්තිකාරම් මුදල් ගෙවා තිබුණි.		
(ඊ)	සමාගමේ කටයුතු සඳහා සම්බන්ධයක් නොමැති බාහිර පුද්ගලයන් සහ ආයතන වලට සමාගමේ ආගන්තුක නිවාස වල නවාතැන් සහ ආහාර පාන සැපයීම වෙනුවෙන් 2020 ජනවාරි සිට 2022 අප්‍රේල් මස දක්වා රු.10,260,433 ක් වැයකර තිබුණි.	සමාගමේ ආගන්තුක නිවාසවල නවාතැන් සහ කෑම බීම සැපයීම සඳහා දරා තිබුණු මුදල සම්බන්ධව විස්තරාත්මක වාර්තාවක් පිළියෙල කර ඇති අතර එය කඩිනමින් ඉදිරිපත් කරන බව.	සමාගමට සිදුකර තිබෙන අලාභය කඩිනමින් අය කර ගත යුතු අතර වගකිවයුතු පාර්ශ්වයන්ට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
(උ)	උක් වගාව සඳහා සමාගමෙන් රු.1,262,363,910 ක ණය ලබාගත් ගොවීන්ගෙන් උක් වගාවෙන් බැහැර වෙනත් වගාවන් සඳහා යොමු වී තිබුණු ගොවීන් 159 දෙනෙකු නැවත උක් වගාව සඳහා යොමුකරවීමට සහ එම ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද එම ලැබිය යුතු ගොවිණය වලින් රු.61,527,826 ක් වසර 05 කට වඩා පැරණි ණය වන අතර රු.77,719,383 ක් වසර 03 ත් 05 ත් අතර කාලයකට අදාළ ණය ශේෂ වේ.	අනවසර වගාකරුවන් උක් වගාවට නැඹුරු කර ගැනීමත් සමඟ මෙම ණය ශේෂය අඩුවන බව, වාර්ෂිකව අනවසර වගාවන් වෙත පෙළඹෙන පිරිසක් ද සිටින බැවින් මෙම ණය ශේෂය ශුන්‍ය කළ නොහැකි බව සහ අනවසර වගාවක් උක් වගාවට යොමු කිරීම සඳහා අවම වශයෙන් වසර දෙකක කාලයක් ගතවන බැවින් ණය අයකර ගැනීම සඳහාද සැලකිය යුතු කාලයක් ගතවන බව.	ගොවිණය කළමනාකරණය සම්බන්ධයෙන් විධිමත් අභ්‍යන්තර පාලන පද්ධතීන් හඳුන්වාදිය යුතු අතර විධිමත් වැඩපිළිවෙලක් සකස් කර පැරණි ණය ශේෂ අය කර ගත යුතුය.
(ඌ)	සෙවනගල අංශයේ භාවිතයෙන් ඉවත් කර තිබුණු වාහන 18 කට අදාළ රු.13,041,107 ක් වූ ද්‍රව්‍ය හා උපකරණ ඒකක 2284 ක් සහ ගබඩාව තුළ වසර 05 කට වැඩි කාලයක සිට භාවිතයට නොගන්නා වටිනාකම	මෙම අමතර කොටස් සම්බන්ධයෙන් නඩු කටයුත්තක් පවතින බැවින් ඉවත් කිරීම සම්බන්ධ තීරණයකට එළඹීමේ නෛතික බාධා පවතින බව.	උසාවි නියෝගය ලද පසු ඒ අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

	රු.85,305,687 ක් වන ද්‍රව්‍ය හා උපකරණ ඒකක 6269 ක් සුදුසු පරිදි අපහරණය කිරීමට කටයුතු නොකර ගබඩාවේ රඳවා තිබුණි.		
(එ)	සෙවනගල අංශයේ ප්‍රධාන ගබඩාවේ තිබුණු විවෘත වෙළඳපොල වටිනාකම රු.560,700 ක් වූ පිත්තල හා තඹ කිලෝග්‍රෑම් 1486 ක ඌනතාවයක් තිබුණි.	මේ සම්බන්ධයෙන් විමර්ශනයක් ක්‍රියාත්මක වෙමින් පවතින අතර එම වාර්තාව ඉදිරියේදී ලබාදීමට කටයුතු කරන බව.	සමාගමට සිදුකර තිබෙන අලාභය කඩිනමින් අය කර ගත යුතු අතර වගකිවයුතු පාර්ශ්වයන්ට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඒ)	පැල්වත්ත අංශය විසින් සමාලෝචිත වර්ෂයේදී විකුණා තිබුණු නමුත් තොග සමීක්ෂණ අවස්ථාව වන විටත් ගැනුම්කරුවන් විසින් ඉවත් කරගෙන නොතිබුණු සීනි මෙට්‍රික් ටොන් 2626 ක් ගබඩාවේ පැවති අතර තෙවන පාර්ශවයකට අයත් මෙම තොගය සඳහා සමාගම විසින් දින 04 ක සිට දින 48 ක් දක්වා කාලයක් ගබඩා පහසුකම් සපයා තිබුණි. තවද විකුණුම් වටිනාකම රු.885,962,222 ක් වූ තෙවන පාර්ශවයකට අයත් තොග ගබඩාවේ රඳවා තබා ගැනීම මගින් සමාගම විසින් ගබඩා පිරිවැයක් දරා තිබීම, අවධානමක් දරා තිබීම සහ රු.7,589,750 ප්‍රමාද ගාස්තු ද අය කරගෙන නොතිබුණි.	දුඹුරුසීනි වෙළඳපළෙහි පවතින අර්බුදකාරී තත්ත්වය නිසා සීනි තොග ඉවත් කර ගැනීමටට ගැනුම්කරුවන් විශාල කාලයක් ගන්නා බව, ප්‍රමාද ගාස්තු අය කිරීමේදී ගැනුම්කරුවන් ඉදිරි ටෙන්ඩර් සඳහා ඉදිරිපත්වීම සීමාවන බව.	අයකර නොමැති ප්‍රමාද ගාස්තු අයකර ගැනීමටත් මෙවැනි තත්ත්වයක් යටතේ සමාගමට ඇතිවන අවධානම, දැරිය යුතු අතිරේක පිරිවැය සහ ප්‍රමාද ගාස්තු අයකිරීම සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කිරීමත් කළ යුතුය.
(ඔ)	සමාගමේ පැල්වත්ත අංශයේ හෙක්ටයාර් 4.607 ක ඉඩම් 4 ක පිරිවැය වූ රු.44,149,728 ක් ගිණුම්වල දක්වා තිබුණු නමුත් එයින් පිරිවැය රු.28,050,728 ක පැල්වත්ත හා ප්‍රධාන කාර්යාලය පිහිටි හෙක්ටයාර් 1.686 ක ඉඩම් වල අයිතිය සමාගම සතුව නොපැවතුණි.	පැල්වත්ත සහ ප්‍රධාන කාර්යාලය පිහිට ඉඩම්වල අයිතිය සම්බන්ධයෙන් ගැටලුව තවමත් විසඳී නොමැති බව සහ ප්‍රධාන කාර්යාලය සම්බන්ධයෙන් නඩුවක් විභාග වෙමින් පවතින බව.	සමාගම විසින් භුක්ති විඳින ඉඩම්වල අයිතිය පවරා ගැනීමට සහ ගිණුම්වල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය.
(ඕ)	2018 වර්ෂයේදී සෙවනගල අංශය විසින් රු.9,564,866 ක් වටිනා වාෂ්පීකරණ යන්ත්‍රයක් (Evaporator) ඉන්දියාවෙන්	අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීමට වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග	විගණන කමිටුවේ උපදෙස් අනුව කටයුතු කර සමාගමට සිදුවී තිබෙන අලාභය නැවත අය කර ගත යුතුය.

	ආනයනය කර රු.3,924,394 ක රේගු ගාස්තු ගෙවා තිබුණි. ඊට අදාල උපාංග (SS Tube) පිරිවිතරවලට එකඟ නොවීම මත ආපසු යවා 2019 වර්ෂයේදී නැවත ආනයනය කිරීමේදී ගෙවා තිබුණු රු.4,830,446 ක රේගු ගාස්තුව සැපයුම්කරුගෙන් අයකර ගැනීමට කටයුතු නොකිරීමෙන් එම වටිනාකම සමාගමට පාඩුවක් වී තිබුණි.	ගැනීමට 2024 දෙවන කාර්තුවේ විගණන කමිටුවේදී උපදෙස් ලබාදුන් බව.	
(ක)	සෙවනගල ඒකකය සතු කලාප අංක 04 (කොවුල් ආර) සහ කලාප අංක 05 (ගිනිගල්පැලැස්ස) අයත් ඉඩම් හෙක්ටයාර් 1072.89 ප්‍රමාණයකින් හෙක්ටයාර් 74.21 ප්‍රමාණයක් අනවසර බෝග වගාවන් සහ හෙක්ටයාර් 8.32 ක ප්‍රමාණයක අනවසර ඉදිකිරීම් (නිවාස සහ වෙළඳසැල්) සිදුකර තිබුණි.	විගණන නිරීක්ෂණය සමඟ සමග එකඟවන බව සහ අනවසර ක්‍රියාවන් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන බව.	මෙම අනවසර ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් සැලකිය යුතු කාලයක් ගතවී ඇති බැවින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කඩිනම් කළ යුතුය.
(ග)	සෙවනගල ඒකකයේ 2023 වර්ෂයේ නිලධාරීන් සහ ගොවිමහතුන් සඳහා සීනි කිලෝග්‍රෑම් 276015 ක් රු.65 ක මිලකට සහ කිලෝග්‍රෑම් 208195 ක් රු.170 ක මිලකට ලබා දී තිබුණි. 2023 වර්ෂයේ සීනි කිලෝග්‍රෑම් එකක නිෂ්පාදන පිරිවැය රු. 262.69 ක් වී තිබුණු අතර නිෂ්පාදන පිරිවැය ආවරණය නොවන මිලකට සීනි තොග ලබාදීමෙන් සමාගමට රු.73,863,484 ක අලාභයක් සිදු වී තිබුණි.	විගණන නිරීක්ෂණය සමග එකඟවන බව, රජයට පවරා ගැනීමට පෙර සිට මෙම සහනය ක්‍රියාත්මක කර තිබුණු බව සහ තීරණයක් ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරන බව.	නිෂ්පාදන පිරිවැයට වඩා අඩු මුදලට තොග ලබාදීම මගින් ඇති වන අලාභයන් වළක්වා ගැනීමට පියවර ගත යුතුය.
(ච)	අවශ්‍යතා නිසි පරිදි හඳුනා නොගෙන ගබඩා අයිතම මිලදීගෙන තිබුණු බැවින් රු.133,653,982 ක් වටිනා තොග අයිතම 7931 ක් වසර 05 ක කාලයක සිට නිෂ්කාර්යව ගබඩාවේ රඳවා තිබුණි.	පැල්වත්ත ඒකකයේ ඇති වසර 05කට වඩා පැරණි තොග අයිතම 1662 අපහරණය කරමින් පවතින බව.	භාවිතයට ගත නොහැකි පැරණි තොග අයිතම විධිමත් පරිදි අපහරණය කළ යුතුය.

(ජ)	පැල්වත්ත අංශය විසින් 2013 වර්ෂයේදී කල් බදු පහසුකම් යටතේ රු.128,910,000 ක ක්‍රේන් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා රු.120,750,000 ක මුදලක් හා ඊට අවශ්‍ය විදුලිය සැපයීමට රු.2,254,850 ක් වැය කර තිබුණි. එසේ වුවද, සැපයුම්කරු විසින් එකඟ වූ පරිදි එම යන්ත්‍රය කර්මාන්තායතනය තුළ ස්ථාපිත නොකිරීම හේතුවෙන් රු.123,004,850ක පිරිවැයක් දරා තිබුණු මෙම යන්ත්‍රය මිලදීගත් දින සිට ප්‍රයෝජනයට ගත නොහැකිව නිශ්කාර්යව පැවතුනි.	අදාළ සැපයුම්කරුට එරෙහිව නඩු පැවරීමට කටයුතු කර ඇති බව.	මෙම අනාර්ථික වියදම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශ්වයන්ට පෙරෙහිව විධිමත් ක්‍රියාමාර්ග ගතයුතුය.
(ට)	ලංකා සීනි සමාගමේ ප්‍රධාන කාර්යාලය විසින් මොලැසස් මෙට්‍රික් ටොන් 5000 ක් ආනයනය කිරීම සඳහා බලපත්‍ර ගාස්තු වශයෙන් ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව වෙත රු.4,445,682 ක් 2022 වර්ෂයේදී ගෙවා තිබුණු ද සමාගම මොලැසස් ආනයනය කර නොතිබුණු බැවින් ඒ සඳහා දරන ලද වියදම නිෂ්කාර්යය වී තිබුණි.	මේ සඳහා ණයවර ලිපි විවෘත කිරීමට කටයුතු කළ නමුත් විදේශ සංචිත හිඟතාවය මත 2023 වර්ෂය තෙක් කල් තැබීමට සිදුවිය. ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුවට ගෙවන ලද මුදල නැවත ගෙවීම එම දෙපාර්තමේන්තුව ප්‍රතික්ෂේප කර ඇත.	ආර්ථිකයේ පැවති අර්බුදකාරී තත්ත්වය පිළිබඳව නිසි අවධානයකින් හා සැලකිල්ලකින් තොරව සමාගමේ අරමුදල් වැය කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශ්වයන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය.